පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : **492**

ආයතනයේ නම : **තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය සහ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව**

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் :492

நிறுவனத்தின் பெயர் : **இளைஞர் விவகார மற்றும் விளையாட்டுத்துறை அமைச்சு மற்றும் விளையாட்டு அபிவிருத்தித் திணைக்களம்**

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No: **492**

Name of the institution: **Ministry of Youth Affairs and Sports, Department of Sports Development**

Submission of observations of Hon.Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No.119(4)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 492

ආයතනයේ නම - තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය සහ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

| | කමිටුව විසින් හඳුනාගත් වැරදි සහ අඩුපාඩු | ගනුලැබූ ක්‍රියාමාර්ග හා වර්තමාන ප්‍රගතිය පිළිබඳ පැහැදිලි කිරීම් |
|---|---|---|
| | | පළමු කොටස |
| 01. | විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි. | සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කරන මෙන් සියළුම අංශ ප්‍රධානීන් දැනුවත් කර ඇති අතර මෙ පිළිබඳව ත්‍රෛමාසිකව පවත්වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලදී ද සාකච්ඡා කර පසු විපරම් කිරීම සිදු කරනු ලැබේ. අද වන විට මසක් ඇතුලත පිළිතුරු සැපයීමට කටයුතු කරනු ලැබේ. |
| 02. | අභ්‍යන්තර විගණන විමසුම සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය. | අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කරන මෙන් සියළුම අංශ ප්‍රධානීන් දැනුවත් කර ඇති අතර මෙ පිළිබඳව ත්‍රෛමාසිකව පවත්වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලදී ද සාකච්ඡා කර පසු විපරම් කිරීම සිදු කරනු ලැබේ. අදවන විට මසක් ඇතුලත පිළිතුරු සැපයීමට කටයුතු කරනු ලැබේ. |
| 03. | සියලු වාහන වල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත. | වර්තමානයේ අමාත්‍යාංශය සතු වාහන අතුරින් වාහන 04ක පමණක් ලියාපදිංචි සහතික අමාත්‍යාංශය සතුව නොපවතින අතර එම වාහන පවරා ගැනිමට අදාළව ඉදිරි කටයුතු සිදු කරමින් පවති.එය පහත පරිදි වේ.<br>I. PB – 9860 සහ PE – 7746 යන වාහන පවරා ගැනිමට අදාළ ලිපි ලේඛන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත.<br>II. JO – 9554 සහ PA – 9349 යන වාහන පවරා ගැනිමට අදාළ කටයුතු සිදුකරමින් පවති. |
| 04. | පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2023.12.31 දින වන විට පැවති වසර 02ක ඉක්මවූ තැන්පතු වටිනාකම වන රු.21,345,073.16ක අගයෙන් 2024.12.31වන විට රු.21,295,073.16ක ප්‍රමාණයක් නිදහස් කර ඇත. ඉතිරි කල් ඉකුත්වූ රු.50,000.00ක තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.අනුකූලව කටයුතු කිරිමට අදාල නිලධාරින් දැනුවත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවති. |
| 05. | අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි. | 2023 වසර මැද දි පැවති රාජ්‍ය අමාත්‍යාංශ අහෝසි විමේ ප්‍රතිපත්තිමය තීරණය සමඟ පැවති ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය හා ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය ඒකාබද්ධ විම නිසා සිදු වූ කාර්ය මණ්ඩල අනුයුක්ත විම හේතුවෙන් අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය පැවතුනි. ඉන් අනතුරුව ස්ථාන මාරු විම, විදේශ නිවාඩු, සේවය හැරයාම් යනාදිය හේතුවෙන් මෙ වන විට අනුමත කාර්ය මණ්ඩල ඉක්මවීමක් නොමැත. |

| | | |
|---|---|---|
| | දෙවැනි කොටස | |
| 06. | සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබාදී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි. | 2023 වර්ෂය සඳහා සැලසුම්ගත පුහුණු අවස්ථා ප්‍රමාණය එවකට පැවති 03/2022 වියදම් කළමණාකරන චක්‍රලේඛය හේතුවෙන් සීමා කිරීමට සිදුවූ අතර, පුහුණු අවස්ථාවලින් 50%කට අධික අත්‍යාවශ්‍යම පුහුණු අවස්ථා ප්‍රමාණයක් ලබාදීමට කටයුතු කර ඇත.<br>එමෙන්ම, මේ වන විට අමාත්‍යාංශයේ නිලධාරීන් හට පුහුණු අවස්ථා හැකි උපරිම අයුරින් ලබාදීමට කටයුතු කර ඇත. |
| 07. | ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය,යටත්ව මට්ටමේ/ ව්‍යාචන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය. | 2021,2022 හා 2023 වර්ෂයන් සඳහා වන විගණකාධිපති වාර්තා තුලින් ගිණුම් සත්‍ය හා සාධාරණ මතය ප්‍රකාශ කර ඇත. |
| 08. | සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. | 2023 වර්ෂයට අදාළව වත්කම් සහ බැරකම් ප්‍රකාශ අමාත්‍යාංශයේ නිලධාරීන් 23 දෙනෙකුගෙන් ලැබිය යුතුව තිබුණි. එයින් අමාත්‍යාංශයේ නිලධාරීන් 18ක් 2023 වර්ෂයට අදාළව වත්කම් සහ බැරකම් ප්‍රකාශ ලබාදී ඇත. නිලධාරීන් 05 දෙනෙකු විසින් වත්කම් සහ බැරකම් ප්‍රකාශ ලබාදී නොමැති අතර මෙම නිලධාරීන් හට වත්කම් බැරකම් ප්‍රකාශ ලබාදෙන ලෙස ලිඛිතව සහ වාචිකව දැනුවත් කර ඇත. |
| | **ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව<br>මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මගින් රාජ්‍ය ආයතන ඇගයීම (2023 මුදල් වර්ෂය) පිළිබඳ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නවවැනි වාර්තාව** | |
| | පළමු කොටස | |
| 09. | අවදානම් ලේඛනය යාවත්කාලීන පවත්වා නැත. | අවදානම් ලේඛනය මේ වන විට යාවත්කාලීන කර ඇත. |
| 10. | විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි. | ගිණුම් අංශයේ කාලයක සිට පැවතෙන සේවක පුරප්පාඩුව හේතුවෙන් එක් නිලධාරියෙකු විසින් රාජකාරී කටයුතු කිහිපයක නිරතවීම සහ ගිණුම් අංශයට ලද විගණන විමසුම් වලට අදාළ පැහැදිලි කිරීම් දෙපාර්තමේන්තුවේ එක් එක් අංශය විසින් (ඉංජිනේරු / ප්‍රසම්පාදන / ආයතන / ක්‍රීඩා ) ලබාගෙන අවසන් වාර්තා පිළියෙල කිරීමේදී එම අංශවලින් ලැබීමට කාලයක් ගත විමයි.මෙම දූර්වලතා මගහැර ගැනීමට විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දීමට එක් නිලධාරියෙකු වර්තමානයේ පත් කර ඇති අතර විගණන විමසුම් වලට පැහැදිලි කිරීම් පිළිතුරු ගන්නා ක්‍රියාමාර්ග ලබා දීමට ප්‍රමුඛතාවය ලබාදෙන මෙන් සියලු අංශ දැනුවත් කර ඇත.දැනට ලැබෙන විගණන විමසුම් වලට මසක් ඇතුළත පිළිතුරු ලබා දීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. |
| 11. | වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | මෙම දෙපාර්තමේන්තුවේ සේවය කර මේ වන විට සේවය අත්හැර ගොස් ඇති රියදුරු පී.ඩී.අධිකාරි මයා විසින් ලබාගන්නා ආපදා ණය මුදල සඳහා ඔහුගේ ඇපකරු වන ජී.සී.ගමගේ මයාගෙන්ද, එච්.පී.ඩී.එස්.විජේවීර මයාගේ ඇපකරු වන රොහාන් නිලංග මයාගෙන් ද 2026 පෙබරවාරි මාසයේ සිට වාරික වශයෙන් අයකරගැනීමට කටයුතු කර ඇති අතර එම්.ඉසෙඩ්.එම්.රිම්සි මයාගෙන් සහ ඒ.ආර්.අයි.හසන් මයාගේ ආපදා ණය මුදල් අයකරගැනීම සඳහා නීතිමය පියවර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. |

| | | |
|---|---|---|
| | දෙවැනි කොටස | |
| 12. | ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පත්වාගෙන ගොස් නොතිබුණි. | 2023 වර්ෂයේදි වෙබ් අඩවිය අකර්මන්‍ය තත්වයේ පැවති අතර 2025 වර්ෂයේදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකර SLT (ශ්‍රී ලංකා ටෙලිකොම්) ආයතනය තෝරා ගෙන නව වෙබ් අඩවියක් නිර්මාණය කිරීම ආරම්භ කරන ලදි. ඒ අනුව 2026 ජනවාරි මාසයේ දි නව වෙබ් අඩවිය ආරම්භ කර පවත්වාගෙන යනු ලබයි. |
| 13. | ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දි නොතිබුණි. | 2023 වර්ෂයේදි නව වෙබ් අඩවිය අකර්මන්‍ය තත්වයේ පැවති අතර මේ වන විට එය යාවත්කාලින කර ඇත. නව වෙබ් අඩවියෙහි මහජනයාට පැමිණිලි හා ප්‍රසංශා සටහන් කිරීමට අවස්ථාව සලසා දි ඇත. |
| 14. | සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබාදි තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුනි. | 2023 වර්ෂය සඳහා සැලසුම්ගත පුහුණු අවස්ථා ප්‍රමාණය එවකට පැවති 03/2022 වියදම් කළමණාකරන චක්‍රලේඛය හේතුවෙන් සීමා කිරීමට සිදුවු අතර, 2025 වර්ෂයේ පුහුණු අවස්ථා ප්‍රමාණය 100%කින් ප්‍රගතියක් වාර්තා කර ඇත. |
| 15. | ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය. | ක්‍රි.සං.දෙ.2024 වර්ෂයේ අවසන් මූල්‍ය වාර්තා සම්බන්ධයෙන් විගණකාධිපති විසින් යටත් මතයක් ඉදිරිපත් කර ඇත.ඉදිරි වර්ෂ වලදි මූල්‍ය වාර්තා සම්බන්ධයෙන් සත්‍ය හා සාධාරණ මතයක් ලබා ගැනිම සඳහා අවශ්‍ය අභ්‍යන්තර පාලනයක් ඇති කිරීමට කටයුතු සිදුකරමින් පවති. |
| 16. | 2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදන ප්‍රකාරව ආයතනය විසින් ඉටුකල යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධක දර්ශක 03ක් හඳුනාගෙන නොතිබුණි. | 2023 වාර්ෂික කාර්යය සාධන වාර්තාවේ 4වන පරිච්ඡේදයේ ආයතනයේ කාර්යය සාධන දර්ශක 2ක්<br>1. අදාළ වර්ෂය තුළ නිමකල ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රමණය<br>2. අන්තර්ජාතික පදක්කම් ප්‍රමාණය<br><br>ලෙස හඳුනාගෙන තිබුණි ( ඇමුණුම 01). නමුත් මෙම වර්ෂය තුලදි චක්‍රලේඛ ප්‍රකාරව කාර්යය සාධන දර්ශක 03ක් හෝ ඊට වඩා වැඩි ප්‍රමාණයක් හඳුනාගැනිමට කටයුතු කරමින් පවති. |

සුනිල් කුමාර ගමගේ (පා.ම)
තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍ය

2026.06.02
දිනය

සුනිල් කුමාර ගමගේ (පා.ම.),
තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍ය
තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය
අංක 09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.


ඇමුණුම 01
Annexure 01


# වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2023


# வருடாந்த செயற்சாதனை அறிக்கை - 2023


# Annual Performance Report - 2023











ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

விளையாட்டு அபிவிருத்தித் திணைக்களம்

**Department of Sports Development**

## 04. පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව)

ජේ.පී.සී.ඩී. ධර්මසිරි
අධ්‍යක්ෂ (සැලසුම්)
ශ්‍රී ලංකා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව
9, පිලිප් ගුණවර්ධන මාවත

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| 1. අදාල වර්ෂය තුළ නිමකල ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රමාණය | – | – | ✓ |
| 2. අන්තර්ජාතික පදක්කම් ප්‍රමාණය | – | – | ✓ |

## 05. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු දක්වන්න.

| ඉලක්කය / අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50 % - 74% | 75% - 100% |
| නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගෙම සුබ සාධනය ප්‍රවර්ධනය කිරීම. | 2030 වන විට බෝ නොවන රෝග නිසා සිදුවන අකල් මරණ, නිවාරණය සහ ප්‍රතිකාර කිරීම මඟින් තුනෙන් එකකින් (1/3) අඩුකර ගැනීම සහ මානසික සෞඛ්‍ය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම. | මහජන ශාරීරික යෝග්‍යතාවය උදෙසා පැවැත් වූ වැඩසටහන් ප්‍රමාණය | √ | – | – |
| සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම | 2028 වන විට ප්‍රධාන ක්‍රීඩා 5කින් ඔලිම්පික් පාරිසාධන මට්ටම කරා ළඟාවීම හා ජයග්‍රහණයක් ලබා ගැනීම | හඳුනාගත් ක්‍රීඩා තරඟාවලින්හි දී සහ ශූරතාවලදී දිනාගත් ජාත්‍යන්තර පදක්කම් ගණන | – | – | – |
| ළමුන් සඳහා ආයෝජනය කරන සෑම දරුවෙක්ටම ප්‍රවණ්ඩත්වයෙන් තොරව වැඩීමට අවස්ථාව සැලසීම. | ජාතික මට්ටමින් ක්‍රීඩා උළෙල පැවැත්වීම | ජාතික මහා ක්‍රීඩා උළෙල දී පිහිටුවන ලද ශ්‍රී ලංකා වාර්තා ගණන | – | – | – |
| | දැනට ක්‍රීඩා යටිතල පහසුකම් භාවිතා කරන සංඛ්‍යාව වාර්ෂිකව 20% කින් ඉහළ නැංවීම | ක්‍රීඩා යටිතල පහසුකම් භාවිතයට ගන්නා පුද්ගලයින් ප්‍රමාණය | √ | – | – |